# බැංකු අධීක්ෂණ ඒකකය

## දැක්ම

ගණුදෙනුකරුවන්ට විශිෂ්ඨ සේවයක් සපයන සඵලදායී හා කාර්යක්ෂම සමෘද්ධි බැංකුවක්

## මෙහෙවර

ජාතික ආර්ථිකයක් ගොඩනැගීමේ කාර්යයේදී සමෘද්ධි ප්‍රතිලාභීන් හා දිවිනැගුම අඩු ආදායම්ලාභීන් ස්වශක්තියෙන් නගාසිටුවීම සඳහා අවශ්‍ය ක්ෂුද්‍ර මූල්‍යකරණය සමග ඉදිරියට යමින් තම ගණුදෙනුකරුවන් වෙත විශිෂ්ඨ සේවයක් සපයන සඵලදායී හා කාර්යක්ෂම සමෘද්ධි බැංකු ජාලයක් ගොඩනැගීම.

## අරමුණු

1. සමෘද්ධි බැංකු සංගම්හි කටයුතු නිරතුරුව අධීක්ෂණයට ලක් කිරීම සහ බැංකු මූල්‍ය අංශයෙන් නිකුත් කල මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි හා අභ්‍යන්තර මගපෙන්වීම් අනුව කටයුතු කරන්නේද යන්න පරීක්ෂා කිරීම.

2. බැංකු සංගමයේ කටයුතු දිගටම පසුවිපරම් කිරීම තුලින් ගණුදෙනුකරුවන්ට හොඳ සේවාවක් ලබාදීමට පියවර ගැනීම.

3. විවිධ පුද්ගලයන්ගෙන් හා ආයතන මගින් සමෘද්ධි බැංකු සංගම් වෙත එල්ල විය හැකි පැමිණිලි, චෝදනා හා දෝෂාරෝපණ අවම කර ගැනීම.

4.සිදුවිය හැකි අයථා ක්‍රියා, අපහරණයන් සහ වංචාවන් අඩුකර ගැනීම.

5.බැංකු සංගම්/මහා සංගම් විනිවිදභාවයෙන් කටයුතු කිරීම.

6.කාර්යක්ෂම හා ඵලදායී සේවයක් සපයන බැංකු සංගමයක්/මහා සංගමයක් සහ කාර්ය මණ්ඩලයක් බිහි කිරීම.

7.බැංකු සංගම්/මහා සංගම් වල කේවල ශේෂ පිරික්සුම් සහ පොදු ලෙජරය නිරන්තර තුලනය වීම.

8.දෛනික, මාසික, වාර්ෂික බැංකු සංගම් රාජකාරි මැනවින් ඉටුකිරීම අධීක්ෂණය හා පසුවිපරම.

9.බැංකු සංගමයේ/මහා සංගමයේ ආයතනික කටයුතු නිසිපරිදි ඉටු කිරීම අධීක්ෂණය.

10.බැංකු සංගමය/මහා සංගමය තුල ඇතිවන සෑම ගැටළුවක්ම නිරවුල් කිරීම හා අවශ්‍ය මගපෙන්වීම, උපදෙස් ලබාදීම.

11.ක්ෂේත්‍රයේ කුඩා කණ්ඩායම්, සමෘද්ධි සමිති අධීක්ෂණය හා පසුවිපරම.

12.සමෘද්ධි බැංකු සංගමයේ කාර්යයන් හා අනුබද්ධිතව සමාජ සජීවීකරණ වැඩසටහන සාර්ථක කිරීම.

13.විගණන දෝශ අවම කිරීම.

14.බැංකු සංගමයේ/මහා සංගමයේ මූල්‍ය කළමනාකරණය පිලිබඳව සත්‍ය හා සාධාරණ විගණන මතයක් සෑම බැංකු සංගමයකම/මහා සංගමයකම ඇති කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම.

15.බැංකු සංගම් හා මහා සංගම් කාර්ය මණ්ඩලය තුල මනා විනයගරුක භාවයක් ඇති කිරීම.

16.ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය තුල මනා බැංකු පරිචයක් ඇති කිරීම.